# වාර්ෂික වාර්තාව
# 2013



**උද්භිද උද්‍යාන භාර අරමුදල**

**ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව**

**පේරාදෙණිය**

# ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුභ සාධනය සඳහා භාර අරමුදල

## වාර්ෂික වාර්තාව - 2013 (Annual Report – 2013)

ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන වැඩි දියුණු කිරීම හා සුභ සාධනය සඳහා භාර අරමුදලක් මැයෙන් එවකට කෘෂිකර්ම ඉඩම් හා වන සම්පත් ඇමතිවරයා විසින් ඉදිරිපත් කරන ලද 1995-12-15 දිනැති සංදේශය සලකා බලා 1996 - 02 - 07 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුභ සාධනය සඳහා භාර අරමුදල පිහිටුවීම සඳහා අනුමැතිය ලබාදී ඇත.

උද්භිද උද්‍යාන සඳහා වන ප්‍රවේශ පත්‍ර විකිණීමෙන් ලැබෙන ආදායමින් වාර්ෂිකව 25% ක් උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම හා සුභ සාධනය සඳහා භාර අරමුදලට ආදායම වශයෙන් නාමිකව බැර කරනු ලැබේ. මේ සඳහා සෑම වර්ෂයකම භාණ්ඩාගාර අනුමත ඇස්තමේන්තුවේ 2201 වැය විෂය (ප්‍රාග්ධන මාරු) යටතේ ප්‍රතිපාදන වෙන්කර දී ඇත. අරමුදලේ වියදම් දැරීමට අවශ්‍ය මුදල්, අවශ්‍යතාවය අනුව දෙපාර්තමේන්තුවේ අග්‍රිම මුදලින් ලබාගෙන වර්ෂය අවසානයේ පියවීම් කරනු ලැබේ. ඊට අමතරව අරමුදලේ ආදායම වැඩිකර ගැනිම සඳහා සුදුසු කාර්යයන් ඉටු කර ගැනිමට ද ඉඩකඩ සලසා ඇත.

මෙම අරමුදල භාරකාර මණ්ඩලයකින් පාලනය වන අතර, එම භාරකාර මණ්ඩලයේ සභාපති වශයෙන් රේඛීය අමාත්‍යාංශයේ ලේකම් ද , භාරකාර මණ්ඩලයේ ලේකම් වශයෙන් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ද, භාරකාර මණ්ඩලයේ සාමාජික වශයෙන් මහා භාණ්ඩාගාරයේ අය - වැය අධ්‍යක්ෂ ද කටයුතු කරනු ලැබේ.

### උද්භිද උද්‍යාන භාර අරමුදල

| | | |
|---|---|---|
| 1. අරමුදලේ නම | : | **ශ්‍රී ලංකාවේ උද්භිද උද්‍යාන සංවර්ධනය කිරීම සහ සුභ සාධනය සඳහා භාර අරමුදල** |
| 2. ස්වභාවය | : | **උද්භිද උද්‍යාන සංවර්ධන කටයුතු සහ අවශ්‍ය අවස්ථාවන්හි පුනරාවර්තන කටයුතුවලට මූල්‍ය සහාය ලබාදීම** |
| 3. අදාල චක්‍රලේඛයන් | : | **I අරමුදල ආරම්භ කිරීම - 1917 අංක 09 දරණ අරමුදල් ආඥා පනත අනුව**<br>**II ගිණුම් තැබීම හා ගිණුම් වාර්තා කිරීම භාණ්ඩාගාර චක්‍රලේඛ 1977 අගෝස්තු 16 දිනැති අංක 836 දරණ චක්‍රලේඛය.** |
| 4. ආරම්භ කළ දිනය | : | **1996 දෙසැම්බර් 20** |
| 5. කාර්යාලය | : | **පේරාදෙණිය ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය** |
| 6. බැංකුව | : | **පේරාදෙණිය ලංකා බැංකුව : ගිණුම් අංක 0007040848** |

## 7. අරමුදලේ පරමාර්ථ:

- ★ ශ්‍රී ලංකාවේ හා විදේශ රටවල් තුල උද්භිද උද්‍යාන පිළිබඳව පවතින ප්‍රතිරූපය තවදුරටත් යහපත් කිරීමේ ක්‍රියා මාර්ග ගැනිම.
- ★ පාරිසරික අධ්‍යාපනික හා ශාක පිළිබඳව දැනට පවත්නා සංරක්ෂණය සම්බන්ධයෙන් අර්ථාන්විත වැඩසටහන් ක්‍රියාත්මක කොට දියත් කිරීම.
- ★ උද්භිද උද්‍යානයන්හි සේවා නියුක්ත විද්‍යාඥයින්ගේ විද්‍යාත්මක දැනුම, ක්‍රියාකාරකම් හා පහසුකම් වැඩි දියුණු කිරිම මෙන්ම අදාල කටයුතු සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනිමට මුල්‍යමය ආධාර සැපයිම.
- ★ ශාක එකතුව පිළිබඳව ද වර්ධනාත්මක වැඩ පිළිවෙලක් ඇති කිරීම.
- ★ උද්භිද උද්‍යානයන්හි ප්‍රයෝජනය සඳහා පාරිසරික අධ්‍යාපනික සංරක්ෂණ හා වැඩි දියුණු කිරීමේ කටයුතු සම්බන්ධයෙන් කාර්මික ක්ෂේත්‍රයන්හි ක්‍රියාකාරකම් වර්ධනය කිරීම හා ඊට ආධාර කිරීම.
- ★ විද්‍යාඥයින්ට හා උද්භිද උද්‍යානයට පැමිණෙන අයට අවශ්‍ය පහසුකම් සැපයිම සඳහා අවශ්‍ය ඕනෑම හදිසි ඉදිකිරිමේ කටයුත්තක් භාර ගැනිම.
- ★ අවශ්‍ය අවස්ථාවන්හිදී පුනරාවර්තන ප්‍රතිපාදන වල ඌණතාවයන් ඌණපුරණය කිරීම.

### 2013 වර්ෂයේ අරමුදලේ මුදල් ප්‍රගතිය

| | | | |
|---|---|---|---|
| 2013-01-01 දිනට බැර ශේෂය | = | රු. | 62,715,391.60 |
| **එකතු කළා:** | | | |
| 2013 වර්ෂයේ ආදායම (බැර කිරීම්) | = | රු. | 132,957,387.02 |
| | | | -------------------- |
| එකතුව | | රු. | 195,672,778.62 |
| **අඩු කළා :** | | | |
| 2013 වර්ෂයේ වියදම් (හර කිරීම්) | = | රු. | 86,335,273.76 |
| | | | -------------------- |
| 2013.12.31 දිනට භාණ්ඩාගාර ශේෂය | = | **රු.** | **109,337,504.86** |

* (මෙම ශේෂය නාමික ශේෂයක් පමනි)

## අරමුදලේ ප්‍රතිපාදනය යොදා ගනිමින් 2013 වර්ෂයේ ඉටු කරන ලද විශේෂිත සංවර්ධන කාර්යයන්

- මෙම වර්ෂයේ උද්‍යාන අලංකරණය සඳහා උද්භිද උද්‍යාන භාර අරමුදල යටතේ ප්‍රතිපාදන සලසමින් පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය සහ හක්ගල උද්‍යානය ඉතා ආකර්ශනීය මට්ටමකින් වර්ෂය තුල පවත්වාගෙන යන ලදී.



රාජකීය උද්භිද උද්‍යානයේ දර්ශනයක්





- පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ ප්‍රධාන මාර්ග කි.මී 2.65 ක දුර ප්‍රමාණයක් කාපට් අතුරා ඉතා හොඳ මට්ටමකින් පිළිසකර කර ඇත. ඒ අනුව උද්‍යානයේ අලංකාරත්වය තවත් ඉහළ නැංවීමට කටයුතු කර ඇත.



පැරණි ගොඩනැගිල්ල

- පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ පැරණි ක්ෂේත්‍ර කාර්යාලය ගොඩනැගිල්ල නව සුභ සාධක ආපනශාලාව ලෙස වැඩි දියුණු කිරීම සඳහා අරමුදල යටතේ ප්‍රතිපාදන දරා ඇත. මේ අනුව සේවකයින්ගේ සුභ සාධනය වෙනුවෙන් විශාල සේවයක් සැලසීමට මේ වසර තුල හැකි විය.



නව සුභ සාධක ආපනශාලා ගොඩනැගිල්ල

- පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ ක්ෂේත්‍ර කටයුතු කාර්යක්ෂමව ඉටු කර ගැනීම සඳහා ක්ෂේත්‍ර කාර්යාලයක් ඉදි කිරීම සඳහා උද්‍යාන භාර අරමුදල යටතේ ප්‍රතිපාදන සලසා ඇත. එය මෙම වසරේ ප්‍රතිපාදන යොදා ගනිමින් ඉතා සාර්ථකව නිම කරන ලදී.



පේරාදෙණිය උද්භිද උද්‍යානයේ කේෂ්ත්‍ර කාර්යාල ගොඩනැගිල්ල

මෙම කේෂ්ත්‍ර කාර්යාලය වැඩ මුලික මහතාගේ කාමරය, වඩු වැඩපල, කම්මල් අංශය, මිකැනික් අංශය, ලේබල් ලියන කාමරය, ගස් නඩත්තු අංශය ආදි වශයෙන් සියලු කේෂ්ත්‍ර කාර්යාල එක් තැන් කර ඇති අතර, සේවක සුභ සාධනය වෙනුවෙන් කාන්තා හා පිරිමි යන කොටස් දෙකට වෙන් වෙන් වශයෙන් ඇඳුම් මාරු කිරීමේ කාමර සහ ආහාර හා තේ පානය සඳහා ඉඩ පහසුකම් සලසා ඇත.



රාජකීය උද්භිද උද්‍යානයේ කුළු බඩු උයන අසල වැසිකිලි ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමෙන් පසු

- පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම යටතේ පැරණි වැසිකිලි ගොඩනැගිලි නවීකරණය කර වැඩි දියුණු කිරීම සඳහා අරමුදල යටතේ ප්‍රතිපාදන සලසා ඇත. ඒ අනුව උද්භිද උද්‍යාන නැරඹීමට පැමිණෙන සංචාරකයින්ගේ සනීපාරක්ෂක කටයුතු වෙනුවෙන් ඉහළ ප්‍රමුඛතාවයක් මෙම වසරේදී ලබා දී ඇත.

- රාජකීය උද්භිද උද්‍යානයේ ඇන්තූරියම් තවානේ පැල ගෘහය ඉදිකිරීම සහ මල්වගා අංශයේ පටක රෝපණ රසායනාගාරයේ කාණු පද්ධතිය අලුත්වැඩියාව, කැක්ටස් ගෘහය අලුත්වැඩියාව වැනි සංවර්ධන වැඩ ද මෙම වර්ෂයේ අරමුදලේ ප්‍රතිපාදන යොදා ගනිමින් සිදු කර ඇත. මේ යටතේ උද්‍යානය පැල නිෂ්පාදන අංශ සහ මහජනයාට නැරඹීම සඳහා ඇති ස්ථාන (කැක්ටස් ගෘහය වැනි) වැඩි දියුණු කර ඇත.



- අරමුදල යටතේ ප්‍රතිපාදන යොදා ගනිමින් 2012 වර්ෂයේ දී මෙම දෙපාර්තමේන්තුව වෙත පවරා ගත් හඳබිම අධිකාරියට අයත් ගොඩනැගිල්ලේ බිම් මහල මෙම වසරේදී අලුත්වැඩියා කරන ලදී.



මෙම ගොඩනැගිල්ල පවරා ගැනිමට පෙර ප්‍රධාන කාර්යාලයේ නිලධාරින්ට තම රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් තරම් පහසුකම් නොමැතිව තිබුනි. එම අවස්ථාවේ මෙම ගොඩනැගිල්ල පවරා ගෙන බිම් මහල වැඩි දියුණු කර නිලධාරින්ගේ පහසුකම් වැඩි දියුණු කිරීමට අරමුදල යටතේ හැකි විය. වැඩිදියුණු කිරීම් වලින් පසු 2013 වසර අග භාගයේ සිට දෙපාර්තමේන්තුවේ ආයතන අංශය මෙහි පිහිටුවා ඇත.



බැටරි බලයෙන් ක්‍රියාකරන වාහනයක ගමන් ගන්නා නරඹන්නන් පිරිසක්

- පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුවට සමගාමීව පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය නැරඹීම සඳහා පැමිණි රාජ්‍ය නායකයින් සහ පරිවාරක පිරිස පේරාදෙණිය උද්භිද උද්‍යානය තුල ප්‍රවාහනය කිරීම සඳහා බැටරි බලයෙන් ක්‍රියාකරන GOLF CART රථ 06 ක් ගෙන්විමට අරමුදලෙන් ප්‍රතිපාදන සලසා ඇත.

පසුව මෙම රථ උද්භිද උද්‍යානය නැරඹීමට පැමිණෙන සංචාරකයින්ගේ පහසුව සඳහා පැය එකකට රු. 500/- බැගින් වන මුදලක් අයකර සංචාරකයින්ගේ ගමන් පහසුව සඳහා යොදවන ලදී. ඒ අනුව රථ තුනක් පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයට සහ අනික් රථ තුන හම්බන්තොට වියළි කලාපීය උද්භිද උද්‍යානයේ සේවය සඳහා යොදවා ඇත. මෙම රථවලින් ලැබෙන ආදායම උද්භිද උද්‍යාන භාර අරමුදලේ ආදායමක් ලෙස ගිණුම් ගත කෙරේ. ඒ අනුව අරමුදලේ ආදායම වැඩි කර ගැනිම සඳහා ද කටයුතු සැලසී ඇත.



- රාජකීය උද්භිද උද්‍යානය තුළ පිහිටි අධ්‍යාපන හා පුහුණු මධ්‍යස්ථානයේ; පුහුණු කිරීම් කටයුතු වලදී උද්‍යාන අලංකරණ සැලසුම් සකස් කිරීමේදී

පිලියෙල කරන සිතියම් සැකසීම සඳහා අදාල මෘදුකාංග භාවිතා කිරීම සඳහා සුදුසු පරිගනක 10 ක් මිලදී ගන්නා ලදී. මේ සඳහා අරමුදලෙන් ප්‍රතිපාදන සලසා ගෙන ඇත.

මේ අනුව පුහුණුලාභින්ව පුහුණු කිරීමේ කටයුතු කාර්යක්ෂම කිරීමට හැකියාව ලැබී ඇත.

හක්ගල උද්භිද උද්‍යානයේ සංවර්ධන වැඩ කිහිපයක් අරමුදලේ ප්‍රතිපාදන යොදා ගනිමින් ඉටු කර ඇත.


- උද්‍යානයේ අභ්‍යන්තර මාර්ගවල තත්ත්වය ඉහල නැංවීමට සහ උද්‍යාන අලංකරණය ඉහල නැංවීම සඳහා “ ඉන්ටර්ලොක්ස් (Interlocks)” අතුරා අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩි දියුණු කර ඇත.
- මේ අනුව හක්ගල උද්‍යානය නැරඹීමට පැමිණෙන සංචාරකයන්ට පහසුවෙන් ඇවිද යමින් උද්‍යානය නැරඹීමට පහසුකම් සලසා ඇත.


උද්‍යානයේ අභ්‍යන්තර මාර්ග ඉන්ටර්ලොක් අතුරා සංවර්ධනය කර ඇත.

- උද්‍යානයේ නඩත්තු කටයුතු සඳහා සහ බීමට ලබා ගන්නා ජලය උද්‍යානයේ ඉහල උල්පත් වලින් නල මාර්ගයෙන් මෙම ප්‍රධාන ජල තටාකයට ලබාගෙන මෙම තටාකය හරහා ප්‍රයෝජනයට ගනු ලැබේ. මෙම ප්‍රධාන ජල තටාකය ඉතා පැරණි වන අතර, උද්‍යානය ආරම්භයේදී ඉදිකරන ලද්දකි. වසර සිය ගණන් පැරණි එම ජල තටාකය ජලය කාන්දුවීම් තිබු බැවින් අරමුදලේ ප්‍රතිපාදන යොදා ගනිමින් පැරණි බවද ආරක්ෂා කරගනිමින් පිළිසකර කිරීම ආරම්භ කරන ලදී.


ජල තටාකයේ අලුත්වැඩියා කටයුතු සිදුවන ආකාරය

- ඉඩම් සංවර්ධන කටයුතු යටතේ උද්‍යානයේ වැසිජලය විධිමත්ව බැසි යාම සඳහා කාණු පද්ධති ඉදිකිරීම මෙම වසරේදී සිදු කරන ලදි. මේ මගින් උද්‍යානයේ පාරවල් වැසි කාලයට සොදා පාළුවීම් වලක්වා ගත හැකි විය.



උද්‍යානයේ කාණු පද්ධතියේ ඉදිකිරීම් කටයුතු සිදුවන අයුරු

- උද්භිද උද්‍යානවල නිලධාරින්ගේ දැනුම වැඩි දියුණු කිරීම යටතේ සේවයේ නියුතු උද්භිද උද්‍යානවල විවිධ මට්ටමේ තනතුරුවල නිලධාරින්ගේ සහ සේවකයින්ගේ දැනුම සහ නවීන ක්‍රමවේද පිළිබඳ දැනීම වර්ධනය කිරීම සඳහා පුහුණු කිරීම් සහ වැඩමුළුවලට සහභාගි කරවන ලදී

- දෙපාර්තමේන්තුවේ උද්භිද විද්‍යා පර්යේෂණ කටයුතු යටතේ ශාක ගවේෂණ කටයුතු, ශාක හඳුනාගැනිමේ කටයුතු සහ ශාක නිදර්ශක රැස්කිරීමේ කටයතු මෙම වසරේදී ප්‍රමානවත් තරම් සිදු කරන ලදී.



ශාක ගවේෂණ කටයුතු සිදු කරන අවස්ථාවන්



ශාක ගවේෂණ කටයුතු සිදු කරන අවස්ථාවන්

## අරමුදල යටතේ 2013 වර්ෂය තුල ඉටු කරන ලද විශේෂිත සංවර්ධන කාර්යයන් පිළිබඳ සාරාංශය

| කාර්යය | වියදම (රු) |
|---|---|
| 1. උද්භිද උද්‍යාන පහසුකම් වැඩි දියුණු කිරිම, උද්‍යාන අලංකරණ කටයුතු | 4,496,599.00 |
| 2. උද්භිද උද්‍යානවල ඉඩම් සංවර්ධන කටයුතු | 19,249,946.00 |
| 3. උද්භිද උද්‍යානවල ගොඩනැගිලි සංවර්ධන කටයුතු | 27,896,552.00 |
| 4. පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා උපකරණ මිලදී ගැනීම (බැටරි බලයෙන් ක්‍රියා කරන ආසන 8 කාර් 06 ක් සමඟ) | 15,283,130.00 |
| 5. පර්යේෂණ හා පුහුණු කටයුතු හා පුස්තකාල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා | 500,000.00 |
| එකතුව | 67,426,227.00 |

ආචාර්ය විලී ගමගේ
සභාපති, උද්භිද උද්‍යාන භාර අරමුදල සහ
ලේකම්, උද්භිද උද්‍යාන සහ පොදු
විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය.

ආචාර්ය ඩී.එස්.ඒ. විජේසුන්දර
ලේකම්, උද්භිද උද්‍යාන භාර සහ අරමුදල
අධ්‍යක්ෂ ජනරාල් ,
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව.